කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **01** TCA/26/05/11/01
වර්ණය : ඇම්බර්


ශ්‍රී ලංකාව ආශ්‍රිතව පවතින අඩු පීඩන කලාපය පිලිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2026 මැයි මස 11 දින ප.ව. 3.00 ට නිකුත් කරන ලදී.

අවධානයෙන් සිටින්න!

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති පහල වායුගෝලීය කැළඹිලි ස්වභාවය අඩු පීඩන කලාපයක් දක්වා වර්ධනය වී 10.1N, 82.5E ආසන්නයේ පවතී. මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන්, දිවයිනේ දැනට පවතින වැසි තත්ත්වය ඉදිරි දින කිහිපයේදී තවදුරටත් බලාපොරොත්තුවේ.

තවද මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් දිවයින වටාවන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවලත්, බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශවලත් තද සුළං ඇතිවිය හැකි අතර මුහුදු ප්‍රදේශ රළු වීමේ හැකියාවක් පවතී.



නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින අඩු පීඩන කලාපයේ පිහිටීම

අද(11) දින දත්ත මත පදනම්ව ඉදිරි පැය 168 තුළ පීඩන අවපාතයක් දක්වා වර්ධනය වීමේ සම්භාවිතාව

ඉදිරි පැය 24	ඉදිරි පැය 24-48	ඉදිරි පැය 48-72	ඉදිරි පැය 72-96	ඉදිරි පැය 96-120	ඉදිරි පැය 120-144	ඉදිරි පැය 144-168
නැත	නැත	නැත	අඩු මට්ටමේ	අඩු මට්ටමේ	අඩු මට්ටමේ	නැත

මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාව ඇතුළු මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

මීළඟ නිවේදනය 2026 මැයි 12 වන දින ප.ව. 3.00 ට නිකුත් කෙරේ.